ඝාතන-දිවි තොර කරගැනීම් සඳහා මාධ්‍ය තුළත්, සමාජය තුළත් සාපේක්ෂව වැඩි අවධානයක් යොමු වීම ස්වභාවයකි. එනිසාම, එවැනි සිදුවීම් වාර්තා කිරීමේදී විශේෂ ප්‍රවේසම් වීමක් සහ මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුකූල වීමක් අත්‍යාවශ්‍ය වෙයි.

ඊට උදාහරණ ලෙසින් 2021.09.10 සහ 11 දෙදින තුළ සිරස ටීවී, හිරු ටීවී සහ ස්වර්ණවාහිනී ප්‍රධාන පුවත් විකාශයන් තුළ ඝාතන/දිවි තොර කරගැනීමේ සිදුවීමක් ආවරණය වී තිබූ ආකාරය පහත අයුරින් පෙළගැස්විය හැක.

1) මෙවැනි අවස්ථාවකදී දිවි තොර කරගත් ආකාරය නොදක්වන ලෙසින් පවසන්නේ, එම ආකාරය භාවිතයෙන් අනුකාරක දිවි තොරකරගැනීම් සිදුවිය හැකි බැවිනි.

2) දිවි තොර කරගත් අයගේ ඡායාරූප පළ කිරීමේදී විශේෂ සැලකිල්ලක් දැක්විය යුතු වන්නේ, දිවි තොර කරගැනීමක් හා සම්බන්ධ වන ඡායාරූප, දිවි තොර කරගැනීමේ නැඹුරුතාවයකට පත්විය හැකි අයෙකුට පසුකාලීනව හෝ දිවි තොර කරගැනීමකට නැඹුරු වීමට උත්ප්‍රේරකයක් විය හැකි බැවිනි. එය පර්යේෂණ මගින් පෙන්වා දී ඇත.

3) දිවි තොර කරගත් අය ලියූ ලිපි ආදිය පළ කිරීමද එම දිවි තොර කරගැනීම අනුකරණය කිරීමට තවෙකෙකුට උත්ප්‍රේරණයක් වීමට හැක.

4) මෙවැනි ඝාතන/දිවි තොර කරගැනීමේ සිදුවීම් සමගින්ද හදිසි උපකාරක අංක පළ කිරීම අත්‍යාවශ්‍ය වේ. ඒ ඔස්සේ දිවි තොර කරගැනීමේ නැඹුරුවකින් යුතු අයෙකුගේ දිවි බේරාගැනීමට අවකාශයක් ලැබෙනු ඇත.

හදිසි උපකාරක අංක:
*CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)

**#MediaEthicsSL #lka #sinhalanews #Sirasa #Hiru #Swarnawahini**